# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2017

**සමුපකාර සේවක කොමිෂන් සභාව**

අංක 100 1/1, ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ල,

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,

කොළඹ 02

## දර්ශනය

තෘප්තිමත්

සමුපකාරික මානව සම්පතක් නිර්මාණය

කිරීම

## මෙහෙවර

සමුපකාර ව්‍යාපාරයේ තිරසාර පැවැත්ම උදෙසා

එම ක්ෂේත්‍රයේ

මානව සම්පතෙහි අභිවෘද්ධිය පිණිස

අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම

## කාර්යයන්

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීමේදී, උසස් කිරීමේදී සහ ඔවුන්ට හිමි පාරිතෝෂික දීමනා ලබා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

- සමුපකාර සමිතිවල තනතුරුවලට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම හා එවැනි තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් නියම කිරීම.

- සේවක ආරවුල් විසඳීම, අභියාචනා විභාග කිරීම සහ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින සමුපකාර සමිතිවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

- කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම.

- ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් වූ විනයානුකූල ක්‍රියා මාර්ගයන්හිදී සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටි තීරණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය කිරීමේ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## සමුපකාර සේවක කොමිෂන් සභාව - වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2017

සමුපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතතාව සහ ශුභ සිද්ධිය උදෙසා සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සියලු කාර්යයන් පිළිබඳ විස්තරාත්මක හා සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම මෙම වාර්තාව මගින් සිදු කර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පරිච්ඡේද වලින් සමන්විත වන පරිදි මෙම වාර්තාවෙහි අන්තර්ගතය සකස් කර ඇත.

- **පළමු පරිච්ඡේදය**

  සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා 2017 වර්ෂය තුළ සේවා නියුක්තිය පිළිබඳ කරුණු'.

- **දෙවන පරිච්ඡේදය**

  කොමිෂන් සභාවේ විෂය පථයට අයත්, මුදුන් මට්ටමේ සමුපකාර සංගම් සහ සමිතිවල නාම ලේඛනය හා 2017 වර්ෂය තුළ එම සංගම් /සමිතිවල අනුමත සේවක සංඛ්‍යාව පිළිබඳ කරුණු.

- **තුන්වන පරිච්ඡේදය**

  කොමිෂන් සභා කාර්යාලයේ භෞතික හා මූල්‍ය කටයුතු සහ 2017 වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද සමස්ත කාර්යයන් සමාලෝචනය කිරීම.

  2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති.

# පටුන

## I. පරිච්ඡේදය


කොමිෂන් සභාවේ සංයුතිය,පාලන කටයුතු හා සංවිධාන ව්‍යුහය 02 - 03

2017 වර්ෂයේ සේවා නියුක්තිය 04


## II. පරිච්ඡේදය


මුදුන් මට්ටමේ සමූපකාර සමිති හා සංගම් වල
2017 වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යාව 06 - 08


## III. පරිච්ඡේදය


වර්ෂය තුල සිදු කල සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය 10-15

2017 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය 16-18

2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති 19

## 1 පරිච්ඡේදය

- **කොමිෂන් සභාවේ සංයුතිය, පාලන කටයුතු හා සංවිධාන ව්‍යුහය**
- **2017 වර්ෂයේ සේවා නියුක්තිය**

## සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංයුතිය හා පාලන කටයුතු

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතෙහි 4 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව සමුපකාර විෂය භාර ඇමතිවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් පත් කරන අතර, එකී සාමාජිකයින් තිදෙනාම තම පත්වීමේ දින සිට අවුරුදු 3ක කාල සීමාවක් එකී ධූරයන් දැරිය යුතු වේ. එසේ වුවද සාමාජිකයකුගේ ඉල්ලා අස්වීම, ඇමතිවරයා විසින් එකී ධූරයෙන් ඉවත් කිරීම, මිය යෑම වැනි කරුණු වලදී හිස් වූ පුරප්පාඩුවක් පිරවීමට තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලයට වෙනත් සුදුසු අයෙකු පත් කිරීමට ඇමතිවරයාට හැකිවේ.

2017 වර්ෂයේදී මෙම කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙස ආර්.එම්.සී.ජී.උඩුගම්පොල මහත්මිය කටයුතු කල අතර, සෙසු සාමාජිකයින් ලෙස නීතිඥ අයි.එම්.ජී. ඊරියගොල්ල මහතා සහ නීතිඥ බන්දුල විජේසිංහ මහතා කටයුතු කරන ලදී.


1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු පත් කල යුතුය. එකී ලේකම්වරයා මෙම දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ද වේ.

2017 වර්ෂයේ කොමිෂන් සභාවේ ලේකම්වරිය ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක වන පවිත්‍රා ජයතිස්ස මහත්මිය කටයුතු කරන ලදී.

1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙහි සෙසු නිලධාරීන් ඒකාබද්ධ සේවාවන්ගෙන් පත් කරනු ලැබේ.

1972 සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 12 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ වියදම් මහා භාණ්ඩාගාර වාර්ෂික විසර්ජන පනත යටතේ වෙන් කරනු ලබන මුදල් වලින් සිදු කෙරේ. 2017 වර්ෂයේ වැය ශීර්ෂ 302 යටතේ විසර්ජන පනතින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

# සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය



## 2017 වර්ෂයේ සේවා නියුක්තිය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2017.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 | - |
| ගණකාධිකාරි | 01 | 01 | - |
| නීති නිලධාරි | 01 | - | 01 |
| පරිපාලන නිලධාරි (රාජ්‍ය කළමනාකරණ සහකාර - අධි ශ්‍රේණිය) | 01 | 01 (කොන්ත්‍රාත් පදනම මත) | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (1/11/111) | 08 | 07 | 01 |
| සංවර්ධන නිලධාරි | 05 | 02 | 03 |
| රියදුරු | 03 | 03 | - |
| කාර්යාල කාර්ය සහයක | 03 | 02 | 01 |
| එකතුව | **23** | **17** | **06** |

## ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

| නම | තනතුර | ස්ථාන මාරු වී ගිය දිනය | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| එම්. සී සමන්ලතා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | - | 2017.01.02 |
| ජේ.පී. කමණි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | - | 2017.01.03 |
| එන්. උඩුවාවලගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.01.03 | |
| එච්.ඒ. බන්දුල මයා | සංවර්ධන නිලධාරි | - | 2017.06.11 |
| එම්. සී සමන්ලතා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.07.19 | |

## 11 පරිච්ඡේදය

1. මුදුන් මට්ටමේ සමුපකාර සමිති හා සංගම් වල 2017 වර්ෂයේ

   අනුමත සේවක සංඛ්‍යාව

## ජාතික මට්ටමේ සමුපකාර සංගම් / දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති

සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ අධීක්ෂණයට යටත්වන ජාතික මට්ටමේ සමුපකාර සංගම්/ දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති සේවකයින්ගේ සේවාවන්ට අදාළ වන කරුණු පිළිබඳව නියාමනය කිරීම මෙම කොමිෂන් සභාවට පැවරී ඇත. සමුපකාර සේවකයින්ගේ සේවා ප්‍රශ්න විසඳීම පමණක් නොව තනතුරු සඳහා සුදුසුකම් තීරණය කිරීම, වැටුප් ප්‍රතිශෝධනය කිරීම වැනි කටයුතු ද මෙම කොමිෂන් සභාව මගින් ඉටුකරනු ලැබේ. එසේම අවශ්‍ය අවස්ථාවන්හිදී පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවලට යම් යම් පැහැදිලි කිරීම් හා උපදෙස් ලබා දීමද ජාතික වශයෙන් පොදු එකඟතාවයකින් යුතුව කටයුතු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීමද මෙම කොමිෂන් සභාව මඟින් ඉටු කරනු ලැබේ. පහත සඳහන් සමුපකාර සමිතිවල සේවකයින්ගේ සේවා සම්බන්ධ සියලුම කටයුතු මෙම කොමිෂන් සභාව මගින් නියාමනය කරනු ලැබේ.

**ජාතික මට්ටමේ සමුපකාර සංගම් / දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති වල 2017 වර්ෂයේ සේවා නියුක්තිය**

| සමිතියේ නම | | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| **සමුපකාර සංගම්** | | |
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 55 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය | 42 |
| 03 | සී/ස ශ්‍රී ලංකා පේෂකර්ම සමුපකාර සමිති සංගමය | 06 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 139 |
| 05 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 03 |
| 06 | සී/ස ශ්‍රී ලංකා තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 01 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය | 18 |
| 08 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 84 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 25 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 171 |
| 11 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | 09 |
| 12 | සී/ස ශ්‍රී ලංකා සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 03 |

| | දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති | අනුමත සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 13 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය | 938 |
| 14 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 76 |
| 15 | සී/ස දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සමුපකාර ණය දෙන සමිතිය | 04 |
| 16 | සී/ස තැපැල් හා විදුලි සංදේශ සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 41 |
| 17 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 18 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 24 |
| 19 | සී/ස රජරට විශ්ව විද්‍යාලීය සමුපකාර සමිතිය | 06 |
| 20 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | 07 |
| 21 | සී/ස ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 09 |
| 22 | සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 23 | සී/ස සමෘද්ධි සංවර්ධන, කෘෂිකාර්මික සහකාර නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 05 |
| 24 | සී/ස රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සමුපකාර ණය දෙන සමිතිය | 11 |
| 25 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරින්ගේ ස.ණ.ස. | 11 |
| 26 | සී/ස දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 27 | සී/ස වරාය අධිකාරිය සේවක සමුපකාර බැංකුව | 22 |
| 28 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සමුපකාර ණය දෙන සමිතිය | 34 |
| 29 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරිකිරීම් සමුපකාර ණය දෙන සමිතිය | 70 |
| 30 | සී/ස රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |
| 31 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 02 |

| | | |
|---|---|---|
| 32 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 42 |
| 33 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර ණය දෙන සමිතිය | 10 |
| 34 | සී/ස කොළඹ මහාරෝග්‍යශාලීය සේවක ස.ණ.ස. | 10 |
| 35 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා ශුභ සාධක සමුපකාර සමිතිය | 13 |
| 36 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 43 |
| 37 | සී/ස ස.තො.ස. සේවක සමුපකාර ණය දෙන සමිතිය | 06 |
| 38 | සී.ස වරාය අධිකාරියේ සේවක සුහසාධක ස.ණ.ස. | 14 |
| 39 | සී/ස ශ්‍රී ලාංකික මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර සමිතිය | 02 |
| 40 | සී/ස වතු සේවා නිලධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය | 02 |
| 41 | සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සමුපකාර ණය දෙන සමිතිය | 07 |
| 42 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | 01 |
| 43 | සී/ස ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | 08 |
| 44 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 07 |
| 45 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | 21 |
| 46 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | 20 |

## 111 පරිච්ඡේදය

- වර්ෂය තුළ සිදු කල සාමාන්‍ය හා විශේෂිත කාර්යයන් සමාලෝචනය
- 2017 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය
- 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

## 2017 වර්ෂයේ කරන ලද කාර්යය සමාලෝචනය

❖ සමුපකාර සේවකයන්ට හා සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට කොමිෂන් සභාවේ කාර්යභාරය, කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළයුතු ආකාරය පිළිබඳව සහ කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව සමුපකාර සේවකයින්ට හිමිවන අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2017 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීමට සැලසුම් කළ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එවැනි වැඩසටහන් ඇතුළුව පුහුණු වැඩසටහන් 18ක් පවත්වා ඇත.

**2017 වර්ෂයේ පැවැත් වූ පුහුණු වැඩසටහන්**







## සමුපකාර සේවක වැඩමුළු හා කාර්යය මණ්ඩල වැඩමුළු - 2017

### සමුපකාර සේවකයින් හා කාර්යය මණ්ඩලය සඳහා පැවැත් වූ වැඩමුළු

| | ආයතනය | පැවැත්වූ වැඩමුළුව | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01. | සී/ස වරාය අධිකාරිය සේවක සුභසාධක සකසුරුවම් සහ ණය ගනුදෙනු පිළිබඳ සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 41 |
| 02. | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 39 |
| 03. | සී/ස පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 22 |
| 04. | සී/ස ශ්‍රී ලංකාවේ සණස මහා සංගමය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 30 |
| 05. | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුබසාධක සමූපකාර සංගමය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 17 |
| 06. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය (ප්‍රධාන කාර්යාලයේ කොළඹ ගිණුම් අංශය) | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 54 |
| 07. | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිතිය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 37 |
| 08. | සී/ස ජාතික සමුපකාර මණ්ඩලය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 35 |
| 09. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 43 |
| 10. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ කළුතර දිස්ත්‍රික් කාර්යාලය | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 40 |
| 11. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සේවකයින් සඳහා | සමුපකාර සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 50 |

| | | | |
|---|---|---|---|
| 12. | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ මාතර, හම්බන්තොට සහ කතරගම දිස්ත්‍රික් කාර්යාලය | සේවක ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීම සහ ආකල්ප සංවර්ධනය කිරීම | 46 |
| 13. | සමූපකාර සමිති සභාපතිවරු සහ ලේකම්වරු | සමූපකාර සේවයේ සේවා නියුක්තිකයින් වඩා ඵලදායී අයුරින් සම්බන්ධීකරණය කිරීම | 55 |
| 14 | සමූපකාර දෙපාර්තුමේන්තු නිළධාරින් | සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යභාරය පිළිබඳ දැනුවත් කිරීම | 49 |
| 15 | සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | යහපත් සෞඛ්‍ය රටාවක් වර්ධනය කිරීම | 13 |
| 16 | සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | වැටුප් මෘදුකාංග පුහුණුව | 01 |
| 17 | සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | ආකල්ප සංවර්ධනය කිරීම | 14 |
| 18 | සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය | ධනාත්මක චින්තනය හා අභිප්‍රේරණය පිළිබඳ වැඩමුළුව | 13 |
| | එකතුව | | 599 |

❖ සමුපකාර සේවකයන්ට අදාළ නීතිමය කටයුතු වලදී අධිකරණයට සහාය වීමත් කොමිෂන් සභාව වගඋත්තරකරු ලෙස නම් කර ඇති නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහාය වීමත් මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයකි. 2017 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු 10ක් සඳහා කොමිෂන් සභාව වෙනුවෙන් නිලධාරීන් පෙනී සිට ඇත.

| නඩු අංකය | පැමිණිල්ල | විත්තිය | 2017.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|
| 3267,3275, 3276,3277, 3278,3279, 3280,3281, 3284 | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය විසින් සේවයෙන් ඉවත් කළ සේවක පිරිසක් | සී/ස කම්මල්පත්තු පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.(කොමිෂන් සභාව සාක්ෂි සඳහා කැඳවා තිබුණි) | මාරවිල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ. |

**2017 වර්ෂයේ අලුතින් පවරන ලද මෙම කොමිෂන් සභාව පාර්ශවකරුවකු වන නඩු පිළිබඳ විස්තර**

| නඩු අංකය | **DSP 61/2017** |
|---|---|
| පැමිණිලිකරු | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ සේවකයින් තිදෙනෙක් |
| වගඋත්තර කරු | (EDCS) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය අධ්‍යක්ෂ මණ්ඩලය සහ මෙම කොමිෂන් සභාව |
| අධිකරණය | කොළඹ දිසා අධිකරණය |

**2017වර්ෂයේ මෙම කොමිෂන් සභාව විසින් නඩු පවරා නොමැති අතර ඉහත විස්තර සඳහන් නඩුව පමණක් කොමිෂන් සභාවට විරුද්ධව පවරා ඇත.**

## 2017 වසරේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් සංඛ්‍යාවන්

| මාසය | සමිතිය | තනතුර | අනුමත වූ ගණන |
|---|---|---|---|
| ජනවාරි | - | - | - |
| පෙබරවාරි | තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සාමාන්‍යාධිකාරි | **01** |
| | මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | උපදේශක | **01** |
| | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | බෙදාහැරීමේ කළමණාකරු | - |
| මාර්තු | සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම්කම සහ ණය ගනුදෙනු සමිති මහා සංගමය | කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත්) | - |
| | සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක | **01** |
| අප්‍රේල් | සී/ස රාජ්‍ය සේවා සමූපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සාමාන්‍යාධිකාරි (කොන්ත්‍රාත්) | **01** |
| මැයි | - | - | - |
| ජූනි | ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිති සංගමය | සාමාන්‍යාධිකාරි | - |
| | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමූපකාර සමිතිය | කළමනාකරණ සහකාර (III) | **02** |
| | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | කම්කරු | **01** |
| | සී/ස දුම්රිය මාර්ග වැඩ දෙපාර්තමේන්තු සමූපකාර සමිතිය | කළමනාකරණ සහකාර (II) | **01** |
| ජූලි | - | - | - |
| අගෝස්තු | තැපැල් හා ටෙලිකොම් සේවක සමූපකාර බැංකු සමිතිය | කළමනාකරණ සහකාර | **03** |
| | තැපැල් හා ටෙලිකොම් සේවක සමූපකාර බැංකු සමිතිය | අභ්‍යන්තර විගණක | **01** |
| | සී/ස සමස්ථ ලංකා විචිත්‍ර පැළෑටි හා උඩවැඩියා සමූපකාර සමිතිය | ආංශික කළමණාකරු | **01** |
| සැප්තැම්බර් | සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | කළමනාකරණ සහකාර (III) | **01** |
| ඔක්තෝම්බර් | ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලය | සහකාර සාමාන්‍යාධිකාරි | - |
| | ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | ගණකාධිකාරි | **01** |
| නොවැම්බර් | - | - | - |
| දෙසැම්බර් | - | - | - |
| එකතුව | | | **15** |

**ඉහත කාර්යයන්ට අමතරව 2017 වර්ෂයේ කොමිෂන් සභාව විසින් ඉටුකළ විශේෂ කාර්යයන්**

- සමුපකාර සේවකයින් සඳහා 2016 වර්ෂයේ එළිදක්වන ලද අංක 2016/01 දරණ වැටුප් චක්‍රලේඛය 2017/01/01 දින සිට ක්‍රියාත්මක කිරීම .


- 2016/01 වැටුප් චක්‍රලේඛය පිළිබඳව සහ සමූපකාර සේවක ආයතන සංග්‍රහය පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සඳහා දීපව්‍යාප්ත වැඩමුළු 14 ක් පැවැත්වීම.

- 2016/01 වැටුප් චක්‍රලේඛය පිළිබඳව සමූපකාර සමිති සේවකයින් සහ සමිති විසින් යොමු කරන ලද ගැටළු සඳහා විසඳුම් ලබා දීම.


## 2017 වර්ෂයේ භෞතික හා මූල්‍ය කාර්යඵල සාධනය

පුහුණු කිරීම් හා හැකියා වර්ධනය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන හා ඒ සඳහා 2017 වර්ෂයේදී දරන ලද වියදම්


| | ක්‍රියාකාරකම | අයවැය ඇස්තමේන්තුව (රු.) | 2017.12.31 දිනට වියදම(රු.) | ඉතිරිය (රු.) |
|---|---|---|---|---|
| 01. | සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා | 900,000.00 | 850,701.00 | 49,299.00 |




| | 2016 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 771,900.00 | 850,701.00 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | - | 350,493.89 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | - | 438,338.50 |




| | 2016 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| වැටුප් | 7,531,514.29 | 8,431,101.05 |
| ගමන් වියදම් | 34,902.50 | 306,018.50 |
| සැපයීම් සේවා | 761,028.42 | 811,569.34 |
| නඩත්තු වියදම් | 1,088,327.27 | 1,006,924.85 |
| ගිවිසුම්ගත සේවා | 3,725,681.54 | 3,956,393.31 |
| මාරු කිරීම් | 20,537.20 | 80,099.78 |




| | **2016** (රු.) | **2017** (රු.) |
|---|---|---|
| 1 වන කාර්තුව | 2,797,245.11 | 3,292,979.91 |
| 2 වන කාර්තුව | 3,357,591.74 | 3,293,451.56 |
| 3 වන කාර්තුව | 3,403,966.36 | 3,768,008.66 |
| 4 වන කාර්තුව | 4,375,088.01 | 5,877,200.09 |
| මුළු වියදම | 13,933,891.22 | 16,231,640.22 |

## 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

පහත සඳහන් ව්‍යාපෘති 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත.

| | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාල සීමාව | ඇස්තමේන්තු මුදල | අරමුදල් ප්‍රභවය | අරමුණ |
|---|---|---|---|---|---|
| 01. | සමුපකාර ආයතන සංග්‍රහය ඇසුරින් දැනුවත් කිරීමේ වැඩසටහන් | 2018 ජනවාරි- දෙසැම්බර් | රු.800,000.00 | අයවැය ප්‍රතිපාදන | සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් කළමනාකරණය හා නෛතික විධිවිධාන පිළිබඳව සමුපකාර සේවකයින් හා නිලධාරීන් දැනුවත් කිරීම |
| 02. | කොමිෂන් සභා කාර්යය මණ්ඩලය පුහුණු කිරීම | 2018 ජනවාරි- දෙසැම්බර් | රු.200,000.00 | අයවැය ප්‍රතිපාදන | කොමිෂන් සභා කාර්යය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම |